අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි **30** දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 නත්වාගණුනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය නත්ත්වාගණුනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය ස දහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණුන්දීමේ නිලධාරීගේ හා ගණුන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණුන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණුන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(අ) 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවලට අමුණා තිබිය යුතු CIGAS ඩෙස්ක්ටොප් යෙදුම මඟින් උත්පාදනය කරන ලද ශේෂ පිරික්සුම් හා SA-11, SA-50, SA-51, SA-71, SA-81, හා SA-90 ආකෘති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) යථෝක්ත වක්‍රලේඛයේ 7.2 ඡේදය ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් එකතු කරන ලද ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට (ඒසීඒ-එෆ්) ඇතුළත් නොකළයුතු වූවද, රු.416,189,549 ක් වූ එම වටිනාකම් වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් වශයෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබුණි.

1.6.2 ආදායම් නොවන ලැබීම්/ගෙවීම්

අත්තිකාරම් ලැබීම්/ගෙවීම්

රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි 3.2 ඡේදය ප්‍රකාරව වාර්තාකරන ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සංඛ්‍යා හා භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල සත්‍ය සංඛ්‍යා එකඟ වන බවට සහතික වියයුතු වුවත්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව අත්තිකාරම් ලැබීම් සහ ගෙවීම් පිළිවෙලින් රු.77,436,152 ක් සහ රු.64,679,048 ක් වූවද මූල්‍ය ප්‍රකාශනවල එම අගයන් පිළිවෙලින් රු.77,587,568 ක් සහ රු.65,046,111 ක් ලෙස දක්වා තිබුණි.

1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහනට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සකස්කල එක් එක් ව්‍යාපෘති වාර්තාවල ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ පදනම් සහ ඊට අදාළ නිර්ණායක සඳහන් කර නොතිබුණු අතර, ව්‍යාපෘති වල ප්‍රතිඵල මැනීම සඳහා කාර්ය සාධන දර්ශක ද හඳුනාගෙන නොතිබුණි. එසේම ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති වල ප්‍රතිලාභීන් තෝරාගැනීමේ පදනම් විගණනයට පැහැදිලි නොවීය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

2.1.1 ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දුර්වලතා

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී පූර්වානුමාන කළ හැකි සියළුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුළත් කර ඇති බවට හා ඒවා මුදල් වර්ෂය තුළ තම දෙපාර්තමේන්තුවට ඉටු කළ හැකි බවටත්, ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීමටත් ගණුන් දීමේ නිලධාරියා වගබලා ගතයුතු වුවත්, එලෙස කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පහත දැක්වෙන පරිදි පරිපූරක ප්‍රතිපාදන මගින් හා මුදල් රෙගුලාසි 66 මගින් පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන වැඩිකර ගැනීම මෙන්ම ඉතිරිවීම්වල අසාමාන්‍ය තත්ත්වයක් පැවතීමද සිදුව තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වැය විෂයයන් 02 ක් සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන් කරගෙන නොතිබුණද, ඒ සඳහා රු.275,000,000 ක මුදලක් පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. එම මුදලින් සියයට 81 කට වඩා වැඩි ප්‍රමාණයක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 05 ක් සඳහා සලසා තිබුණු රු.519,000,000 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.322,991,490 ක් ඉතිරි කර තිබුණි. එය එක් එක් වැය විෂයයන්හි ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 38 සිට සියයට 97 ක් දක්වා පරාසයක විය.

2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වීසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 23 ක් විසින් පිළිවෙලින් රු.මිලියන 3164 ක් හා රු.මිලියන 1343 ක් ලෙස එකතුව රු.මිලියන 4508 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් එකතුව රු.මිලියන 3736 ක් උපයෝජනය කර තිබීම හේතුවෙන් ලබාදී තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 771 ක් හෙවත් සියයට 18 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. අමාත්‍යාංශ 07 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළ වියදම් දැරීම සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදනවලින් සියයට 24 සිට සියයට 90 ක් දක්වා ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. දෙපාර්තමේන්තු 11 කට අදාළව සමාලෝචිත වර්ෂය තුළ වියදම් දැරීම සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන වලින් සියයට 24 සිට සියයට 100 දක්වා ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිතිරීති රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
		රු.	
(i)	2009 අංක 22 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධිත) පනතේ 9(අ)(1) සහ (2) වගන්ති		ජාතික රක්ෂිත භූමියට මායිමේ සිට සැතපුම් 01 ක් ඇතුළත කරනු ලබන සියලු සංවර්ධන කටයුතු සඳහා වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගතයුතු වුවද, එවැනි අනුමැතියකින් තොරව විල්පත්තු අභයභූමි මායිමේ සැතපුමක් ඇතුළත (පේරක කලාපය තුළ) පිහිටි ඉඩම්වල කෝමාරිකා වගා ව්‍යාපෘතියක් සහ රෑට අදාළ වෙනත් සංවර්ධන කටයුතු සිදු කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා ජාතික පාරිසරික පරීක්ෂණයක් මගින් පරිසර ඇගයීම් තක්සේරුවක් සිදු කර නොතිබුණි.
(ii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(2)	3,739,319	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක ඉකුත් තැන්පත් පිළිබඳව මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(iii)	ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 2008/04 හා 2008 අගෝස්තු 20 දිනැති චක්‍රලේඛය		ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 04 ක අනාවරණය වී තිබූ විවිධ රක්ෂිත හා රජයේ ඉඩම්වල අනවසර අල්ලා ගැනීම් පාලනය සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගෙන තිබූ නමුත්, අනාවරණය වී තිබූ අනවසර අල්ලා ගැනීම් නිරවුල් කර නොතිබුණි.

(iv)	2018 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය		දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක පවතින භාවිතයට ගත නොහැකි අබලන් වාහන 13 ක් අපහරණය කර නොතිබුණි.
(v)	ජනාධිපති ලේකම්ගේ SP/PCMD/06/2015 හා 2015 ජූනි 16 දිනැති රාජ්‍ය ආයතන විසින් අනුගමනය කළයුතු බලශක්ති සංරක්ෂණ ක්‍රමවේද මැයෙන් වූ චක්‍රලේඛය	4,198,198	රාජ්‍ය ආයතනවල වායුසමීකරණ යන්ත්‍ර සවි කිරීමේදී බලශක්ති සංරක්ෂණයට දායක වන Inverter සහිත වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගෙන සවි කළයුතු වුවද, අවස්ථා 3 කදී මිලදී ගෙන තිබූ වායු සමීකරණ යන්ත්‍ර 27 ක් Inverter රහිත වායු සමීකරණ යන්ත්‍ර විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පදිංචි සහ ගොවිතැන් කටයුතු වල නියැලී ඉඩම් නොමැති අය සඳහා ඉඩම් ලබාදීමට හා දැනට ඉඩම් හිමි එහෙත් නීත්‍යානුකූල අයිතිය නොමැති අය සඳහා විධිමත් බලපත්‍ර ලබාදීම සඳහාත් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් කළමනාකරණය විධිමත් කිරීම සඳහා වූ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් සම්බන්ධ ගැටළු විසඳීමට කටයුතු කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 22 හි වසම් 631 ක් තුළ ඉඩම් කච්චේරි 128 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දීර්ඝකාලීන (වාණිජ) බලපත්‍ර හිමි බදුකරුවන් තිදෙනෙකුගේ බදු බලපත්‍ර කාලය අවසන් වී වසර 2 ක් ඉක්මවා ගොස් තිබුණද, නව තක්සේරුව අනුව බදුකරය දීර්ඝ නොකිරීම හේතුවෙන් එම ඉඩම්වලින් බදු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

3.1.2 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 456, රාජාංගනය යාය 18 ග්‍රාම නිලධාරී වසමේ ගොවීන් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(2) වගන්තිය යටතේ නේවාසික කටයුතුවලට හා ගොවිතැන් කටයුතුවලට බලපත්‍ර ලබාදී ඇති ඉඩම් වල ව්‍යාපාරික අරමුණින් කෝමාරිකා වගා ව්‍යාපෘතියක් සඳහා පෞද්ගලික සමාගමකට අවසර ලබාදී තිබූ අතර, එම අවසරය මත ක්‍රියාත්මක ව්‍යාපෘතිය තුළින් ගොවීන්ගේ ඉඩම් අයිතිය අදාළ සමාගම විසින් අත්පත් කර ගැනීමේ අවදානමකට ලක් වී තිබුණි.

3.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ රු.196,909,215 ක ප්‍රතිපාදන වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති 34 ක් අනුමත ව්‍යාපෘති වාර්තාවේ සඳහන් කාල සීමාව තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් නොකිරීම හේතුවෙන් රු.94,455,778 ක වැඩ කොටස් පමණක් ඉටු කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ රු.33,605,796 ක වටිනාකම් ඇති කාර්යයන් ඉටු කරගත නොහැකි වී තිබුණි.

3.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ ලබානොගැනීම

2016 මාර්තු 21 දිනැති අංක 1/2018 දරන ග්‍රාම ශක්ති ජනතා සමාගම් පිහිටුවීම් මැයෙන් වූ වක්‍රලේඛය ප්‍රකාරව අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර තිබූ ග්‍රාම ශක්ති ජනතා සමාගම්වල වක්‍රිය ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන සමාගම්වල බැංකු ගිණුම් වෙත ලබාදී ඇතත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 ක පිහිටුවා තිබූ ග්‍රාම ශක්ති ජනතා සමාගම් 113 ක් අක්‍රීය තත්ත්වයේ පැවති අතර එම සමාගම් බැංකු ගිණුම්වල රු.32,418,605 ක මුදල් ශේෂයක් ප්‍රයෝජනයට නොගෙන සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවතුණි.

3.1.5 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් ඇමතූ මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ MF/NPD/01/2021 හා 2021 ජනවාරි 11 දිනැති විමධ්‍යගත අයවැය වැඩසටහන 2021 වක්‍රලේඛයේ 5.3 ඡේදය ප්‍රකාරව 2021 වර්ෂයට අදාළ විමධ්‍යගත අයවැය ව්‍යාපෘති නොවැළැක්විය හැකි හේතුවක් හැර 2021 සැප්තැම්බර් 30 දිනට පසු සංශෝධනය නොකළ යුතු වුවද, දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද විමධ්‍යගත අයවැය ව්‍යාපෘති 1489 ක් අතුරින් ව්‍යාපෘති 552 ක්ම 2021 සැප්තැම්බර් 30 දිනට පසුව සංශෝධනය කර අනුමත කර තිබූ අතර, ඒ හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 06 ක ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකිව අත්හැර දැමීමට සිදු වී තිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

3.2.1 අලිමිනිස් ගැටුම අවම කිරීම සඳහා විදුලි වැට නඩත්තුව හා පසු විපරම් ක්‍රියාවලියට අදාළව විදුලි වැට ආශ්‍රිත මුර කුටි 60 ක් ඉදිකිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ රු.56,079,458 ක ප්‍රතිපාදනයෙන් ක්‍රියාත්මක ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සිදු වූ අඩුපාඩු හේතුවෙන් අදාළ ව්‍යාපෘතිය අපේක්ෂිත පරිදි ඉටු කිරීමට නොහැකි වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.10.1 ඡේදය ප්‍රකාරව සහ ලංසු ලේඛනවල ඇති නිර්ණායක මත ප්‍රසම්පාදනයට අදාළ ලංසු ඇගයීමේදී කොන්ත්‍රාත්තුව ඵලදායී ලෙස ඉටු කිරීමට ඇති මූල්‍ය හා තාක්ෂණික හැකියාව හා පෙර පළපුරුද්ද සලකා බලා නොතිබීම හේතුවෙන් වඩාත් සුදුසු කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී අපොහොසත් වීමෙන් අපේක්ෂිත මුරකුටි 60 න් 15 ක් පමණක් ඉදිකිරීම කර කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කාර්යයන් ආරම්භ කිරීමට පෙර සිදු කළයුතු ඉඩම් අත්පත් කර ගැනීම් ඇතුළු උපයෝගී සේවා ප්‍රසම්පාදන අස්තීත්වය විසින් ඉටු කර ගෙන නොතිබීම හේතුවෙන් මුර කුටි 60 න් මුර කුටි 29 ක වැඩ ආරම්භ කිරීමට නොහැකිව අතහැර දමා තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 ප්‍රකාරව ප්‍රසම්පාදනයට අදාළ කාලසටහනක් හා වැඩ සැලැස්මක් ලංසුකරුගෙන් ලබාගෙන අනුමත කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3.2.2 සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ නාමපුවරු 600 ක් සාදා සපයා සවිකිරීම සඳහා රු.1,177,200 ක් ගෙවා තිබූ අතර, ඒ සඳහා සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සුදුසුකම් ලත් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුට අදාළ ටෙන්ඩරය පිරිනැමීමට කටයුතු නොකර ඔහුගේ කැමැත්තකින් තොරව එම මිල ගණන් වලට ඊට වඩා ඉහළ මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුට ටෙන්ඩරය පිරිනමා තිබුණි. මෙම තීරණය තුලින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඇ) ඡේදය ප්‍රකාරව සුදුසුකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සමාන හා උපරිම අවස්ථා ලබාදිය යුතු බවට වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළ මූලික මූලධර්මය උල්ලංඝනය වී තිබුණි.

3.2.3 සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ පවුල් ලක්ෂ 2 ක් සවිබල ගැන්වීම් සඳහා වර්ග 3 කට අයත් වතුර මෝටර් 630 ක් මිලදී ගැනීම සඳහා සිදු කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී සුදුසුකම් ලත් අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරු ලංසු ලේඛන මඟින් ඉල්ලා තිබූ තොරතුරු ඉදිරිපත් කර තිබියදී එය පිළිනොගෙන එම ලංසුකරු ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එම මිලදී ගැනීමේදී රු.5,608,700 ක අලාභයක් සිදු වී තිබුණි.

3.3 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම

3.3.1 නිදහස් නොකළ සේවක ඇප මුදල්

මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ නිලධාරීන් 12 දෙනෙකු 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ වෙනත් සේවා ස්ථාන වෙත ස්ථානමාරු වී ගොස් තිබූ නමුත්, ඇප සඳහා රඳවා ගන්නා ලද ඉතිරි කිරීමේ ගිණුම් පොත් නව සේවා ස්ථානවලට යොමුකර නොතිබුණි.

3.4 දෘෂ්‍ය අක්‍රමිකතා

සෞභාග්‍ය නිෂ්පාදන 'ගම්මාන වැඩසටහන යටතේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද "නිදැලි කුකුල්" පාලන ව්‍යාපෘතිය සඳහා සකස් කර දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත කරන ලද ව්‍යාපෘති වාර්තාව තුළ ව්‍යාපෘතියට අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය වල ප්‍රමිතිය සහ පිරිවිතර ඇතුළත් කර නොතිබීම හා පසුව හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවශ්‍ය පිරිවිතර සකස් කර අනුමත කර නොදීම හේතුවෙන් ව්‍යාපෘතියට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේදී ප්‍රතිලාභීන් වෙත ලබාදෙන ලද රජයේ දායක මුදල් බාහිර පාර්ශවයක් මැදිහත් වී ලබාගෙන ප්‍රමිතියෙන් අඩු ද්‍රව්‍ය මිලදී ගෙන රු.1,514,700 ක මුදලක් බැහැර කරගෙන තිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 1907 අංක 16 දරන වන සංරක්ෂණ ආඥා පනතේ 8(2) වගන්තිය ප්‍රකාරව ඉඩම් විෂය භාර ඇමතිවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව සැකසුණු 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව ප්‍රාදේශීය ලේකම්වරු යටතේ පාලනය වන රජයේ ඉඩම් වල බණිජ ද්‍රව්‍ය එකතු කිරීම් හා ලබාගැනීම් වෙනුවෙන් ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රමාණයට රජයේ ගාස්තු අයකළ යුතු වුවද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ විගණනයට ලක් කරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 05 ක පවත්වාගෙන යන කළුගල් වැඩබිම්වලින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කර තිබූ කලුගල් කැණීම් බලපත්‍රවල සඳහන් ගල් කියුබ් ප්‍රමාණය අඩුවෙන් ගණනය කිරීම

හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රජයේ ගාස්තු ආදායම රු.93,351,257 ක් අයකරගෙන නොතිබුණි. එසේම පෙර වර්ෂයන්ට අදාළ මෙම විෂයයට අයත් රජයේ හිඟ ගාස්තු රු.මිලියන 395 ක්ද අයකර ගතයුතුව තිබුණි.

(ආ) දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 ක ක්‍රියාත්මක කර තිබූ කාන්තා කාර්යාංශ ණය වැඩසටහන් යටතේ නිකුත් කළ ණය වලින් වසර 2 කට වඩා වැඩි කාලයක් වාරික අය නොවන අක්‍රීය ණය එකතුව රු.4,067,489 ක් විය. ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබූ ප්‍රතිපාදන වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 9 ක වැන්දඹු කාන්තා ණය වැඩසටහන් සහ පශු සම්පත් ණය වැඩසටහන් 2020 සහ 2021 වර්ෂ තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. එම ණය වැඩසටහන සඳහා ලද වක්‍රීය ණය අරමුදල් වලින් රු.4,008,456 ක් බැංකු ගිණුම්වල නිශ්කාර්යව පැවතුණි.

(ඇ) දීර්ඝකාලීන බදු පදනම මත ලබාදී ඇති රජයේ ඉඩම් වලින් බදු අයකර ගැනීමේ අකාර්යක්ෂමතාවයක් දක්නට ලැබුණු අතර, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 394,575,735 ක හිඟ බදු අයවිය යුතුව පැවතුණි.

(ඈ) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ කෘෂි කාර්මික කටයුතු හා නේවාසික කටයුතු සඳහා ලබාදී ඇති දීමනා පත්‍ර හිමිකරුවන් විසින් විවිධ සමාගම් වෙත සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීම සඳහා වාණිජ කාර්යයක් වෙනුවෙන් භාවිතා කිරීමට එම ඉඩම්වලින් කොටසක් බැහැර කර ඇති අවස්ථාවලදී, 2020 පෙබරවාරි 06 දිනැති අංක 2020/02 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍රවල පසු කටයුතු මැයෙන් වූ චක්‍රලේඛය ප්‍රකාරව අදාළ දීමනා පත්‍ර රජයට භාරගෙන ඉහත කී චක්‍රලේඛයේ VI කොටසෙහි උපදෙස් අනුව කටයුතු කළයුතු වුවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 14 ක පිහිටි සන්නිවේදන කුළුණු 102 ක් සම්බන්ධයෙන් ඉහත කී චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම යටතේ ලබාදුන් ණය අතුරින් වසර 2-5 අතර කාලයක් ගතවී තිබූ වැඩ නහනම් වූ නිලධාරීන් 04 දෙනෙකුගෙන් සහ මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් එකතුව රු.1,202,025 ක් තවදුරටත් අයවීමට පැවතුණි.

(ඊ) අතිගරු ජනාධිපතිතුමා විසින් අත්සන් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් වෙත එවා තිබූ දීමනා පත්‍ර 380 ක් ලියාපදිංචි කර අදාළ හිමිකරුවන් වෙත භාරදී නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

3.6 අභ්‍යන්තර පාලන දුර්වලතා

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ක්‍රියාත්මක මෝටර් රථ වාහන බලපත්‍ර ආදායම් එකතු කිරීම සහ ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පවත්නා අභ්‍යන්තර පාලනය දුර්වල තත්ත්වයක පවතින බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි සිදු කරන ලද විගණන පරීක්ෂණවලදී අනාවරණය විය. ඒ අනුව විගණනය කරනු ලබන අස්ථිත්වයේ ගණන්දීමේ නිලධාරි විසින් මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක වන බවට හා එය කලින් කලට සමාලෝචනය කර පවත්නා අභ්‍යන්තර පාලනය නිවැරදි කළයුතු බවට 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(ඇ) වගන්තිය ප්‍රකාරව දැක්වුණද, ඉහත කී මෝටර් රථ වාහන බලපත්‍ර ආදායම් එකතු කිරීම හා ගිණුම්ගත කිරීම සම්බන්ධව පවත්නා අභ්‍යන්තර පාලනය විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.7 රාජ්‍ය ගිණුම් කාරක සභා තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2012 ජූනි 30 දින ලබාදී තිබූ නියෝග අනුව 2001-2006 කාලසීමාව තුළ වී මිලදී ගැනීම සඳහා භාණ්ඩාගාරය විසින් ලබාදුන් අත්තිකාරම් මුදලින් ආයතන 06 ක් වෙතින් තවදුරටත් පියවිය යුතු ශේෂය රු.32,247,248 ක් විය.

4 යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2021 වර්ෂයට අදාළ අභ්‍යන්තර විගණන සැලැස්මෙහි අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් 45 කින් ක්‍රියාකාරකම් 16 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව අභ්‍යන්තර විගණන වැඩසටහනට ඇතුළත් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඊට අනුබද්ධ අංශ වල විගණනයක් සිදුකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට කටයුතු කළ බවට සාක්ෂි නොතිබුණි.

5 මානව සම්පත් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 හි අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

කාර්ය මණ්ඩල විස්තර	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ මට්ටම	107	83	24
තෘතීයික මට්ටම	53	28	25
ද්විතීක මට්ටම	2329	2060	269
ප්‍රාථමික මට්ටම	219	190	29
	2708	2361	347

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහකාර අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරුවල පුරප්පාඩු 04 ක් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරේ පුරප්පාඩු 03 ක් වර්ෂය පුරාම පුරප්පාඩුව පැවතුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක පරිපාලන නිලධාරී තනතුර වර්ෂය පුරාම පුරප්පාඩුව පැවතුණි.

ඩබ්.එම්.ජේ.එම්.හුණුකුඹුර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.

ඩබ්.එම්.ජේ.එම්. හුණුකුඹුර
සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත්:-
01. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 02.
02. ලේකම් - රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
1. දිස්ත්‍රික්කය තුළ රාජ්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වන වාර්ෂික සංස්කෘතික වැඩසටහන් නියමිත කාලය තුළ සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කටයුතු සිදුකිරීම.	√		
2. දිස්ත්‍රික්කය තුළ පරිසරය හා ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීම සඳහා වන තීරණ වලට එළඹීම සඳහා සියලු පාර්ශ්වයන් සමග සාකච්ඡා කිරීම, අවශ්‍ය තීරණ ක්‍රියාත්මක කිරීම.	√		
3. රේඛීය අමාත්‍යාංශ මගින් දිස්ත්‍රික්කය තුළ සිදුකරන ව්‍යාපෘතීන් කාර්යයන් අධීක්ෂණය හා පසුවිපරම් කිරීම.	√		
4. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධාන හා මහජන සංවිධාන අධීක්ෂණය හා පහසුකම් සැපයීම.	√		
5. රජය මගින් ප්‍රමුඛ අවධානය ලබාදී ක්‍රියාකරන විශේෂ ව්‍යාපෘති දිස්ත්‍රික් මට්ටමින් සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම.	√		
6. **E-Government** සඳහා අවශ්‍ය වන පසුබිම සැකසීම.			√
7. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුබද්ධ සියලු රාජ්‍ය සේවාකයින්ගේ ආයතන කටයුතු නිසි පරිදි සිදුවන බව තහවුරු කිරීම.	√		
8. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල කටයුතු නිසි කාර්යක්ශමතාවයකින් ක්‍රියාත්මක වන බවට අධීක්ෂණය කිරීම.	√		
9. දිස්ත්‍රික්කය තුළ සමාජ සුභසාධනය තහවුරු කිරීම.	√		
10. දිස්ත්‍රික්ක කෘෂිකර්ම සැලැස්ම සැකසීම හා ක්‍රියාවට නැංවීම.		√	
11. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින සියලු කාර්යය මණ්ඩලය නියමිත ආකාරයට පුහුණු කිරීම.		√	
12. ඵලදායිතා සංකල්ප ප්‍රවර්ධනය හා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.	√		

05 පරිච්ඡේදය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

අනු අංකය	ඉලක්ක/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0%-49%	50-74%	75%-100%
1	අනුරාධපුර දිස්ත්‍රික්කය තුළTJC අඹ අපනයන කලාපයක් පිහිටුවීම	අනුරධපුර දිස්ත්‍රක්කය තුළ TJC අඹ අපනයන ගම්මාන පිහිටුවීම.	අනුරාධපුර දිස්ත්‍රික්කය තුළTJC අඹ පැළ 248686 ක ප්‍රමාණයක් ලබා දීම			√
2	ක්‍රීඩාපිටි ඉදිකිරිම	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 22 ක ක්‍රීඩාපිටි සංවර්ධනය	ක්‍රීඩාපිටි 24ක් ඉදි කිරිම හා සංවර්ධනය			√
3	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන සංවර්ධනය කිරිම තුළින් නිෂ්පාදන ඉහළ නැංවීම	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන 30 ක් බිහි කිරිම	ගම්මාන 30 සංවර්ධනය කිරිම			√
4	ගම්මාන වල යටිතල පහසුකම් සංවර්ධනය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල තෝරාගත් සංවර්ධන වැඩසටහන්	යටිතල පහසුකම් ව්‍යාපෘති 245 ක් ක්‍රියාත්මක කිරිම			√
5	සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන 5 ක් සංවර්ධනය කිරිම	ගම්මාන වල ප්‍රතිලාභින්ගේ යටිතල හා ජීවනෝපාය පහසුකම් ඇති කිරිම	ගම්මාන වල ප්‍රතිලාභින්ගේ යටිතල හා ජීවනෝපාය පහසුකම් ඇති කිරිම			√

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

දිස්ත්‍රික් මට්ටමේ විශේෂ ළඟා කරගැනීම්

01. අඹ ඵලදාව වසර තුනක් තුළ ලබා ගැනීමට අපේක්ෂා කරන අතර ඉන් වැඩි ප්‍රමාණය අපනයන වෙළෙඳාමට යොමු කිරීමට බලාපොරොත්තුවේ.
02. නිෂ්පාද ගම්මාන සජවර්ධනය මඟින් විවිධ නිෂ්පාදන තුළින් දිස්ත්‍රික්කයේ අවශතාවයන් සපුරා ගැනීම
03. සෞඛ්‍ය හා ශාරීරික වර්ධන තුළින් යහපත් ජීවන රටාවක් ලබා දීම
04. අවශ්‍ය යටිතල පහසුකම් හා ජීවෝනෝපාය සංවර්ධනය තුළින් ස්වංරුකියා ව්‍යාපාරය ආරම්භ කිරීම මඟින් ජන ජීවිතය නගා සිටුවීම

අභියෝග

01. අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ අපහසුව
02. ව්‍යාපෘති ක්‍රිවාත්මක කිරීමේදී දේශපාලන මැදිහත්වීම් ඇතිවන බැවින් තිරසර ඉලක්ක කරා ලඟා වීමට අපහසුවීම
03. ග්‍රාමීය ජනතාවගේ හා නිලධාරීන්ගේ ආකල්පමය වෙනස්කම් ඇති කිරීමේ දී ඇති වන ගැටළු

06 පරිච්ඡේදය

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	16	11	-5
තෘතීයික	4	3	-1
ද්විතියික	89	88	-1
ප්‍රාථමික	30	27	-3

06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
රා.ක.ස.1 සේවයේ නිලධාරින්ගේ කාර්යක්ෂමතා කඩයිම් පුහුණු වැඩසටහන						
කාර්යාල කලමණාකරණය හා කාර්යාල ක්‍රම	40	දින 1	1856.25			
රජයේ කාර්යාලවල ප්‍රායෝගිකගිණුම් කටයුතු						
ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය						
මුදල් රෙගුලාසි (රාජ්‍ය මූල්‍ය කළමණාකරණය)						
වත්කම් කළමණාකරණය හා හානි පාඩු						
විනය ක්‍රියා පටිපාටිය						
ලේඛන අපහරණය හා ලේඛනාගාර නඩත්තුව						
කාර්යාල කාර්යය සහායක පුහුණුව						

- ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

රාජකාරී කටයුතු කාර්යෂමව හා සඵලදායීව ඉටුකිරීමට හැකිවීම

07 පරිච්ඡේදය

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	✓		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	✓		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හාලේඛනනඩත්තුකිරීම(මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනයයාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	✓		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		

2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	✓		
3.2	මූල්‍ය බලතල පවරාදීමපිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	✓		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතලපවරාදී තිබීම	✓		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේපාලනයටයටත්ව කටයුතු කිරීම	✓		
4	**වාර්ෂික සැලසුම්සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	✓		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	✓		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	✓		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	✓		

4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	✓		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	නැත	ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් තොරතුරු නොලැබුණු අවස්ථා තිබුණි.	ඉදිරියේදී නියමිත පරිදි තොරතුරු ලබා ගැනීමට කටයුතු කර ඇත.
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	✓		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	✓		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	✓		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	✓		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	නැත	2020 පළමු හා අවසන් රැස්වීම් පවත්වා ඇත.	ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කිරීමට දැනුවත් කර ඇත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	✓		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකරතිබීම	✓		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	✓		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	✓		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	✓		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	✓		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	නැත	හිමිකම් නිරවුල් නොවීම	හිමිකම් නිරවුල් කිරීම සිදුකිරීම.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	✓		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	✓		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	✓		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය	අදාළ නොවේ		

	බැංකු ගිණුම් නිරවුල් කර තිබීම			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	✓		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	✓		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම	✓		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	✓		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	✓		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	✓		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	✓		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	✓		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	✓		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	✓		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	✓		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	✓		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	✓		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	✓		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	✓		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	✓		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	✓		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරතිබීම	✓		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	✓		

17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	✓		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	✓		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	නැත	සකස් කරමින් පවතී	නිශ්චිත වගකීම් පවරා පසු විපරම් කිරීම.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	නැත	සකස් කරමින් පවතී	නිශ්චිත වගකීම් පවරා පසු විපරම් කිරීම.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	නැත	සකස් කරමින් පවතී	නිශ්චිත වගකීම් පවරා පසු විපරම් කිරීම.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	නැත	සකස් කරමින් පවතී	නිශ්චිත වගකීම් පවරා පසු විපරම් කිරීම.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	නැත	සකස් කරමින් පවතී	නිශ්චිත වගකීම් පවරා පසු විපරම් කිරීම.

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	නැත	සකස් කරමින් පවතී	නිශ්චිත වගකීම් පවරා පසු විපරම් කිරීම.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	**ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදිකොට තිබීම.**	✓		